ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. — oaggov@sltnet.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No : එන්සී/ඒපී/ජ/2012/33

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date : 2012 දෙසැම්බර් // දින.

උපකුලපති,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(I) උපවගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය සහ 111 වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2012 දෙසැම්බර් මස 07 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පර්පාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පර්පාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද, ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පර්පාටි සැලසුම් කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 උපස් ගිණුම්කරණ පරිචයන්

සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේදීද ප්‍රයෝජනයට ගෙන තිබුණු පිරිවැය රු180,906,831 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 16 ක් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් ගිණුම්වලට ගෙන නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 12 කට පෙර විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබුණු ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල, කෘෂිකර්ම අංශ ගොඩනැගිල්ල, නිල නිවාස 33 ක් සහ එහි ඉඩම සමාලෝචිත වර්ෂයේදීද පවරාගෙන ඒවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අතුළත් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ නිවාස කුළී උපලේඛනයේ දක්වා තිබුණු කුළි නිවාස හිමියකුට ගෙවිය යුතු නිවාස කුළී රඳවා ගැනීම් රු.34,000 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ නිවාස කුළී ගිණුම, විවිධ ආදායම් ගිණුම සහ ආදායම් ගිණුම පිළිවෙලින් රු.14,000 ක්, රු.12,000 ක් සහ රු.48,000 ක් වශයෙන් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් වියදම් රු.14,000 කින්ද ආදායම් රු.60,000 කින්ද මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉදිරි වර්ෂය වෙනුවෙන් දරන ලද රු.1,218,339 ක් වූ වාහන රක්ෂණ ගාස්තු හා සේවා ගිවිසුම් ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබුණු වත්කම් සඳහා රු.26,773,292 ක් 2012 වර්ෂයේදී ගෙවීම් කළ නමුත්, එකී ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි.

(ඊ) පොලිස් නිවාස පවරා ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු රුපියල් මිලියන 18 වෙනුවෙන් ලැබී තිබුණු රු.8,423,653 ක පොලිය ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර නොතිබුණු නමුත්, එකී මුදල ස්ථාවර තැන්පත් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(උ) දුටුගැමුණු ශිෂ්‍ය නේවාසිකාගාරයේ අප ජල සහ වැසි ජල අපවාහන පද්ධතිය ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබුණු රු.377,165 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ප්‍රාග්ධනීත කර තිබුණු අතර, දෙසැම්බර් 31 දිනට වූ අත්තිකාරම් ශේෂය රු.205,456 ක් විය.

(ඌ) වර්ෂය තුළ නිම වූ විහාර මහාදේවී ශිෂ්‍ය නේවාසිකාගාර ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි රු.655,585 ක් වූ වැඩ වටිනාකම ප්‍රාග්ධනීත කර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් නොනිමි වැඩ ගිණුම වැඩියෙන් ද, ගොඩනැගිලි ගිණුම අඩුවෙන්ද රු.8,195 කින් වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය අඩුවෙන්ද දක්වා තිබුණි.

2.2.3 ලැබිය යුතු ගිණුම්

විශ්‍රාම ගිය, සේවය අතහැරගිය හා ස්ථාන මාරුවීම් ලැබූ සේවකයන් 25 දෙනෙකුගෙන් අයවිය යුතු රු.660,535 ක් වූ ණය ශේෂයන් වර්ෂ 01 ත් 04 ත් අතර කාලයක සිට අය නොවී පැවතුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උපලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා රු.1,676,867,120 ක' වූ ස්ථාවර වත්කම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |
| (i) 29(ඊ) වගන්තිය | විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කාර්යයක් වන බාහිර පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් විශ්වවිද්‍යාල සේවකයන්ට දීමනා ලබාගත නොහැකි වුවත්, බාහිර පාඨමාලා 02 ක පරිපාලන කටයුතු සිදු කිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාල සේවකයන් 20 දෙනෙකු වෙත 2010 නොවැම්බර් සිට 2011 නොවැම්බර් දක්වා රු.540,025 ක් ගෙවා තිබුණි. |
| (ii) 99(i) (ඇ) වගන්තිය | විශ්වවිද්‍යාලයට අයත් වූ කවර ප්‍රභවයකින් හෝ අත්කර ගනු ලැබුවා වූ සියළුම මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළයුතු වුවද, විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන්ගෙන් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.19,036,680 ක් වූ ආදායම් වෙනත් අරමුදල් සඳහා බැර කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 28.5.1 වගන්තිය 28.6 උපවගන්තිය | නියමිත දිනට ඉදිරිපත් නොකළ ගමන් වියදම් අයදුම්පත් 42 කින් අඩු කල යුතු වූ රු.34,594 ක් අඩු කර නොතිබුණු බව නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 570 හා 571 | රු.262,312 ක් වූ ඉකුත් තැන්පතු ශේෂ 57 ක් අදාල ආයතන හෝ පුද්ගලයන් වෙතින් විමසා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 3.6.1 මාර්ගෝපදේශය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සීමාවන් ඉක්මවා දේශනශාලා පුටු 175 ක් රු.498,750 කට මිලට ගෙන තිබුණි. |

(ii) 8.7.1 (ආ) මාර්ගෝපදේශය — ලංසුවක් ප්‍රතිග්‍රහණය කිරීමෙන් අනතුරුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ලංසුකරුට ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කළ යුතු වුවද, රබර් මිශ්‍රිත කොහු මෙට්ට, තේක්ක සමානාය පුටු හා වානේ ඇදුම් රාක්ක සැපයීම සඳහා වූ වටිනාකම රු.1,895,040 ක මිලට ගැනීම් 03 ක් සඳහා ප්‍රතිග්‍රහණ ලිපි නිකුත් කර නොතිබුණි.

(iii) 8.9.3 මාර්ගෝපදේශය — රබර් මිශ්‍රිත කොහු මෙට්ට හා තේක්ක සාමානාය පුටු මිලට ගැනීම් සඳහා වූ එකතු වටිනාකම රු.1,518,720 ක් වූ රු.500,000 ඉක්මවන ලද කොන්ත්‍රාත්තු 02 ක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම්වලට ඇතුළත්ව නොතිබුණි.

2.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක බීඩී/අයිඑන්එස්/ඩීඩබ්ලියුඑස්-ඒ/078 හා 2003 ජුලි 18 දිනැති ලිපියෙන් විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාව හා මාසික හිලව් දීමනාව අදාළ නොකර ගතයුතු බව දක්වා තිබුණු නමුත්, 1998 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාලය සඳහා ගෙවා තිබුණු රු.70,289,679 ක් වූ අධ්‍යයන දීමනා සහ මාසික හිලව් දීමනා මත රු.12,652,144 ක් ද, සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.25,873,837 ක් වූ අධ්‍යයන දීමනාව මත රු.4,837,291 ක් ද විධිමත් අධිකාර බලයක් නොමැතිව අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ දායක මුදල් ගෙවීම සඳහා වැය කර තිබුණි.

(ආ) භාෂා ප්‍රවීණතාවය සඳහා රජයේ නිලධාරීන්ට ගෙවනු ලබන දීමනාව රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට දීර්ග කර නොමැති බව රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඊ/01/174/11(බී) හා 1998 මාර්තු 06 දිනැති ලිපියෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා තිබුණු නමුත්, 1999 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දක්වා වූ කාලය සඳහා එකතුව රු.3,819,268 ක් ද, සමාලෝචිත වර්ෂයේදී රු.298,447 ක් ද භාෂා ප්‍රවීණතා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) නේවාසිකාගාර සඳහා මිහින්තලේ විශ්වවිද්‍යාල භූමියේ පිහිටි පොලිස් නිවාස පවරා ගැනීම වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් 2006 වර්ෂයේදී රුපියල් මිලියන 18 ක් ලබා දී තිබුණු නමුත්, 2011 දෙසැම්බර් 31 වන විටත් එම පවරා ගැනීම සිදු වී නොතිබුණු අතර, ඒ සඳහා ලබාදී තිබුණු මුදල හා 2007 වර්ෂයේ සිට එකී මුදල ආයෝජනය කිරීමෙන් උපයාගෙන තිබුණු රු.9,243,577 ක පොලිය ශේෂ පත්‍ර දිනට පසුව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වෙනත් අරමුණු සඳහා යොදවා තිබුණි.

2.2.7 අවිධිමත් ගනුදෙනු

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 මැයි 06 දිනැති අංක PF/FS/A vehi/2011 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව වාහන අළෙවියෙන් ලැබෙන මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකල යුතු බව අවධාරණය කර තිබුණද, රජරට විශ්වවිද්‍යාලය වාහන අළෙවියෙන් ලද රු.2,011,240 ක මුදල ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණු අතර, අතිවිශේෂ අයිතම යටතේ ආදායම් වියදම් ගිණුමේ දැක්විය යුතු වාහන අපහරනය කිරීමෙන් ලැබුණු ලාභය මෙහෙයුම් ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) ව්‍යවහාරික විද්‍යා පීඨයේ ගිවිසුම් කඩකල ආධුනික කථිකාචාර්යවරයෙකුගේ රු.1,631,991 ක් වූ ඇප බැඳුම්කර වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර, 2009 වර්ෂයේදී කල් ඉකුත් වී තිබුණු එකී ඇප බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.240,000 ක වාර්ෂික කුළියකට බද්දට ගෙන තිබුණු නිවාසයක පදිංචි වී සිටි නිලධාරියෙකුගෙන් ආයතනය සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රකාරව නිවාස කුළී අයකර ගෙන නොතිබුණු අතර 2002 අප්‍රේල් 16 දිනැති අංක 147 /2002 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව රජයේ තක්සේරුකරුගේ වාර්තාවක් ලබා නොගෙන විශ්වවිද්‍යාලය සතු නිවාස 55 කින් රු.45 සිට රු.577 දක්වා වූ මාසික ආර්ථික කුළියක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන තිබුණි. එකී නිවාස 55 සඳහා විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණු රු.973,293 ක් වූ ජල බිල්පත් ගාස්තුවලින් පදිංචිකරුවන්ගෙන් අයකර තිබුණේ 8% ක් වූ රු.76,680 ක් පමණකි.

3. මූල්‍ය සමාලෝචනය

----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු වලින් රු. 150,923,949 ක ඌණතාවයක් ඇති වී තිබුණු අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 173,100,494 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.22,176,545 ක වර්ධනයක් විය.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබී තිබුණු මුදලින් වියදම් දැරීමෙන් පසුව ඌනතාවය රු.21,401,476 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.80,503,790 ක් විය. එම තත්ත්වය මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හරින ලද රු.138,095,617 ක් වූ ස්ථාවර වත්කම් ක්ෂය සඳහා ප්‍රතිපාදනය හා රු.2,848,222 ක් වූ පාර්තෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.150,923,948 ක ඌනතාවය වැඩිවීමට හේතු වී තිබුණි. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය රු.99,084,694 ක්ද, පාර්තෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය රු.3,685,440 ක්ද, වශයෙන් එකතුව රු.102,770,134 ක් ලියාහැරීම ඉකුත් වර්ෂයේ ඌනතාවයට හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත සඳහන් පරිදි වේ.

(අ) විභාග ප්‍රතිඵල

(i) 2011 වර්ෂයේදී පැවැත් වූ අවසන් වසර විභාගය හා උපාධිය සමත් වීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | කෘෂිකර්ම පීඨය | කළමනාකරණ පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අවසන් වසර විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 58 | 173 | 179 | 215 |
| විභාගය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 46 | 109 | 115 | 187 |
| විභාගය අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 12 | 64 | 23<br>41* | 28 |
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් උපාධිය අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය | 21% | 37% | 13% | 13% |

* ව්‍යවහාරික විද්‍යාපීඨය 41 දෙනෙක් විශේෂ උපාධි පාඨමාලාවක් සඳහා තෝරාගෙන තිබුණි.

(ii) පසුගිය වර්ෂ 05 ක කාලය තුල විශ්වවිද්‍යාලය මගින් ආරම්භ කල එක් එක් පීඨවලට අදාලව බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව හා උපාධි ලබා පිට වූ ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

| පීඨයේ නම | බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | | උපාධි ලබා පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2005/ 2006 | 2006/ 2007 | 2007/ 2008 | 2008/ 2009 | 2009/ 2010 | 2010/ 2011 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
| වෛද්‍ය පීඨය | 171 | 180 | 181 | 184 | 180 | 180 | - | - | - | - | - | - |
| කෘෂිකර්ම පීඨය | 74 | 113 | 107 | 108 | 95 | 70 | 12 | 28 | 54 | 91 | 55 | 46 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 95 | 160 | 216 | 173 | 196 | 207 | 40 | 91 | 89 | 92 | 69 | 115 |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | 156 | 225 | 275 | 337 | 330 | 304 | 119 | 192 | 154 | 114 | 181 | 187 |
| කළමනාකරණ පීඨය | 220 | 211 | 279 | 307 | 276 | 355 | 88 | 21 | 162 | 201 | 163 | 109 |
| එකතුව | 716 | 889 | 1058 | 1109 | 1077 | 1116 | 259 | 332 | 459 | 498 | 468 | 457 |

* 2006 වර්ෂයේදී ආරම්භ කරන ලද වෛද්‍ය පීඨයට 2005/2006 අධ්‍යයන වර්ෂයේ දී ඇතුළත් කර ගත් සිසුන්ට උපාධි ලබාදීම 2010 වර්ෂයේ සිදු විය යුතු වුවද 2012 වර්ෂයේ අගෝස්තු මාසය වන විටත් එකී සිසුන්ට උපාධිය ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දී නොතිබුණි. සියළුම පීඨවලට අදාළව එක් එක් වර්ෂයේ විභාග ප්‍රතිඵල සහ එක් එක් වර්ෂයේ බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සාමාන්‍ය සහ විශේෂ උපාධි සමත් ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ පැහැදිලි දත්ත ලබා ගැනීමට හැකි වන ලෙස විභාග හා අධ්‍යයන අංශයේ තොරතුරු රැස්කර නොතිබුණි.

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

සමාලෝචිත වර්ෂයේදී රජරට විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයේ මුළු පිරිවැය හා ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | කෘෂිකර්ම පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | කළමනා කරණ පීඨය | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු. '000) | 82,855 | 117,860 | 106,171 | 108,974 | 144,040 | 559,900 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 415 | 950 | 1,068 | 1,106 | 908 | 4,447 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු. '000) | 200 | 124 | 99 | 98 | 158 | 126 |

(ඇ) 2011 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලය විසින් සැළසුම්කළ දේශන පැය ගණන 37,636 ක් වූ අතර, පැවැත් වූ දේශන පැය ගණන 35,145 ක් වූයෙන් සැළසුම්කළ ප්‍රමාණයෙන් 95% ක් දේශන පවත්වා තිබුණු නමුත්, කළමනාකරණ අධ්‍යයන පීඨය පවත්වා නොතිබුණු දේශන පැය ගණන 1959 ක් වූ අතර, එය සැලසුම් කළ දේශන පැය ගණනින් 20% ක් විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

උපාධි අපේක්ෂකයන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා අදාලත්වය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (Improvement Relevant and Quality of Undergraduate Education Project) යටතේ විශ්වවිද්‍යාලයට ලබාගත හැකිව තිබුණු නමුත්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම නිසා එකී ව්‍යාපෘතිය විසින් ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් රු.1,256,755 ක් වූ භාණ්ඩ මිලට ගැනීම සඳහා විශ්ව විද්‍යාලීය අරමුදලින් වියදම් දැරීමට සිදු වී තිබුණි.

4.3 ආර්ථික නොවු ගණුදෙනු

-----------------------------

විශ්වවිද්‍යාලය විසින් ජල බිල්පත් සහ විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාද කිරීම මත ප්‍රමාද ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් වවුචර් 11 ක් මගින් අවස්ථා 13 කදී රු.6,226 ක් සහ වවුචර් 07 ක් මගින් රු.46,786 ක් ප්‍රමාද ගාස්තු වශයෙන් ගෙවා තිබුණි.

4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩ සැපයීම සඳහා සැපයුම්කරුවන් විසින් ගිවිසුම් ගත කාලය ඉක්මවා දිගු කාලයක් ලබාගෙන ඇතත්, ලංසු කැඳවීම් ලේඛනයෙහි සඳහන් විධිවිධාන පරිදි රු.132,263 ක ප්‍රමාද ගාස්තු අය කර ගෙන නොතිබුණු අවස්ථා 04 ක් නියැදි පරීක්ෂණ වලදී අනාවරණය විය.

(ආ) වානේ කබඩ් 56 ක් මිලට ගැනීමේදී සැපයුම්කරු සමඟ ගිවිසුම්වලට එළඹීමෙන් පසුව විශ්වවිද්‍යාලය විසින් ලබා දුන් ඇණවුම්, සැපයුම්කරු විසින් එකඟ වූ මිලට ලබාදීම ප්‍රතික්ෂේප කිරීම මත, අදාල භාණ්ඩ වෙනත් සැපයුම්කරුවකුගෙන් ලබා ගැනීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට රු.78,994 ක අමතර පිරිවැයක් දැරීමට සිදුව තිබුණි. නීති මගින් කටයුතු කර අලාභය පළමු සැපයුම්කරුගෙන් අයකර ගැනීමට සහ පළමු සැපයුම්කරු අසාධු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.534,778 ක උපකරණ කැබිනට් - මල නොබැඳෙන වානේ (Instrument Cabinet - Stainless Steel) 06 ක් මිලට ගැනීමට අදාලව මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන් දෙදෙනා විසින්ම අතීත කාර්ය සාධනයන් ඉදිරිපත් කර නොතිබියදී අතීත කාර්ය සාධනය ඉදිරිපත් නොකිරීම හේතු ලෙස දක්වා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගේ මිල ගණන් ප්‍රතික්ෂේප කර වැඩි මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් මිලට ගැනීම හේතුවෙන් රු.55,372 ක අලාභයක් සිදු කර තිබුණි.

4.5 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 81 ක හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 42 ක පුරප්පාඩු පැවතුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති තනතුරු පුරප්පාඩු 81 කට අමතරව කථිකාචාර්යවරු 23 දෙනෙකු දේශිය හා විදේශිය ශිෂ්‍යත්ව සහ අධ්‍යයන නිවාඩු ලබා සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයෙන් බැහැර වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කටයුතු සඳහා යොදවා ගැනීමට නොහැකි වූ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 104 ක් වූ අතර, එය අනුමත කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට 42% ක් විය.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය වාර්තා අනුව වැය විෂයයන් 10 ක් සඳහා වෙන් කල රු.33,870,000 ක් වූ ප්‍රතිපාදන රු.26,994,262 කින් ඉක්මවා වියදම් දරා තිබුණු අතර, එය එකී වැය විෂයයන් 10 සඳහා වෙන් කර තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් 80% ක් ඉක්මවා තිබුණි. එසේම, වැය විෂයයන් 05 ක් සඳහා වෙන් කළ රු.10,856,000 ක ප්‍රතිපාදනවලින් රු.5,892,960 ක් ඉතිරිකිරීම් කර තිබුණු අතර, එය එකී වැය විෂයයන් 05 සඳහා වෙන් කර තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් 54% ක් විය. එයින් අයවැය ලේඛනය මුල්‍ය කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) කොන්ත්‍රාත් පාලනය
(ඇ) මානව සම්පත් කළමනාකරණය
(ඈ) අයවැය පාලනය
(ඉ) ලේඛන පවත්වාගෙන යාම

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

**1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාර 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව සම්බන්ධව විශ්වවිද්‍යාලය විසින් ගන්නා වූ ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිලි කිරීම් හා නිවැරදි කිරීම්**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
=yq;fh u[ul gy;fiyf;fofk;
Rajarata University of Sri Lanka

මිහින්තලේ
kpfpd;jNy
Mihintale

ශ්‍රී ලංකා
=yq;fh
Sri Lanka

දුරකථන (පොදු) njhiyNgrp Telephone (General): 025- 2266643, 2266645, 2266646, 2266650, ෆැක්ස් ngf;]; Fax: 025- 2266511, 226651, උපකුලපති Vice Chancellor: 025-2266512, ලේඛකාධිකාරී Registrar: 025-2266511, නි. ලේඛකාධිකාරී Deputy Registrar: 025-2266782, මූල්‍යාධිකාරී, Bursar: 025-2266749

ඔබේ අංකය එන්සී/ජ්පී/ඒ/2012/33
உமது இலக்கம்
Your Ref.:

මගේ අංකය RJT/IA/AR/2013/01
எனது இலக்கம்
My Ref.:-
දිනය Date:- 2013.02.13

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දුව පාර
බත්තරමුල්ල

මහත්මයාණෙනි,

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්ථාව හා සම්බන්ධ විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම සහ ගෙන ඇති ක්‍රියා මාර්ග.**

ඔබගේ අංක එන්සී/ජ්පී/ඒ/2012/33 සහ 2012 දෙසැම්බර් 11 දිනැති විගණකාධිපති වාර්තාව සම්බන්ධව විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම්, ගෙන ඇති ක්‍රියාමාර්ග පැහැදිලි කිරීම් විගණකාධිපති වාර්තාවේ අංක පිළිවෙල අනුව මේ සමග ඉදිරිපත් කරණු ලැබේ.

ස්තූතියි

මහාචාර්ය රංජිත් විජේවර්ධන
උපකුලපති

මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

පිටපත්: ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය
ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යංශය
සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ දැක්වෙන කරුණු පිළිබඳ විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම හා ගෙන ඇති ක්‍රියා මාර්ග**

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106 (2) හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 107 (13) 7(A) වගන්තිය ප්‍රකාර රජරට විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික ගිණුම් වාර්ථා 2012 පෙබරවාරි 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්ෂික ගිණුම් වාර්තාව සඳහා වූ විගණකාධිපති වාර්තාව 2012 දෙසැම්බර් 11 දින ලැබී ඇති අතර ඒ සඳහා විශ්වවිද්‍යාලයේ අදහස් පැහැදිලි කිරීම් හා අද දිනට ගෙන ඇති ක්‍රියාමාර්ග විගණන වාර්තාවේ අංක පිළිවෙල අනුව මේ සමග ඉදිරිපත් කරනු ලැබේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

රජරට විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය පරිගණකගත කිරීම අරම්භ කර ඇත. මේ සඳහා ස්ථාවර වත්කම් තක්සේරු දෙපාර්තමෙන්තුව මගින් 2010.12.31 දිනට තක්සේරු කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව ස්ථාවර වත්කම් වල තක්සේරු කල වටිනාකම් ගිණුම් වාර්තා සමග 2012.12.31 දිනට ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා ඇති තත්වයන් මග හැරි යනු ඇත.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ඉඩම් හා ගොඩනැගිලි විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. ඉඩම් හා ගොඩනැගිලි කිහිපයක හිමිකම් සහතික මේ වන විට විශ්වවිද්‍යාලයට ලැබී ඇත් අතර වටිනාකම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කරනු ලැබේ. එම ක්‍රියාවලිය ඉදිරි වර්ෂ වල නිම කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ නමුත් මේ පිළිබඳ ගිණුම් වාර්තා වල සටහන් ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

(ආ) J/E 324 / 31.12.2012 ජර්නල් සටහන් මගින් 2012 ගිණුම් වාර්තා තුල නිවැරුදි කිරීමට කටයුතු කර ඇත.

(ඇ) J/E 325 / 31.12.2012 ජර්නල් සටහන් මගින් 2012 ගිණුම් වාර්තා තුල නිවැරුදි කිරීමට කටයුතු කර ඇත.

(ඇ) 2012 වර්ෂය වෙනුවෙන් කරන ලද රු 300,173.04 මුදල ජර්නල් අංක J/E 187 / 24.10.2012 යටතේ නිවැරුදි කර ඇත. විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති මුදල නිවැරුදි විය යුතුය.

(ඉ) වෛද්‍ය පීඨ සායනික ගොඩනැගිල්ල සඳහා සවිකිරීමට ගෙන තිබූ වෛද්‍ය උපකරණ සහ විශ්වවිද්‍යාලය වෙනුවෙන් ගෙන තිබූ වත්කම් වල අගය රු 26,773,292.00 ක් 2012 ගිණුම් වාර්තාවල ජර්නල් අංක J/E 194 / 31.12.2012 යටතේ ගැලපීම් කර නිවැරදි කර ඇත.

(ඊ) පොලිස් නිවාස පවරා ගැනීම වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබූ බැංකුවේ තැන්පත් කරන ලද මුදල් සඳහා බැංකුව විසින් පොලිය වශයෙන් ලබා දී තිබූ රු 8,423,653 ක මුදල 2012.12.31 දිනට ස්ථාවර තැන්පතු ගිණුමක යෙදවීම සඳහා ගිණුම් සටහන් යොදා ඇත. එහෙත් 2012 වර්ෂයේ මුල් මාස 2 තුළ භාණ්ඩාගාරයෙන් අරමුදල් නිදහස් කර ගැනීම ගැටළුකාරී තත්වයකට පත්වීම නිසා ඉදිකිරීම් නිමකර ආසන්න වෙමින් තිබූ ගොඩනැගිලි ව්‍යාපෘති වල බිල්පත් නිරවුල් කිරීම සඳහා එම මුදල් තාවකාලිකව යොදා ගැනීමට විශ්වවිද්‍යාලයට සිදුවිය. ඉන්පසු භාණ්ඩාගාරයෙන් අරමුදල් නිදහස් කර ගැනීමත් සමග එම මුදල ලංකා බැංකුවේ අංක 73238734 දරන ස්ථාවර තැන්පත් සහතිකය යටතේ තැන්පත් කර ඇත.

(උ) දුටුගැමුණු නේවාසිකාගාරයේ අප ජල හා වැසි ජල අපවහන පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් ලබාදී තිබූ රු.377,165 ක් වත්කම් ගිණුමෙන් ඉවත් කර ජර්නල් අංක J/E 326 / 31.12.2012 මගින් අත්තිකාරම් ගිණුමට මාරුකර නිවැරදි කර ඇත.

(ඌ) J/E 327 / 31.12.2012 මගින් කෙරීගෙන යන වැඩ ගිණුම බැර කර ශිෂ්‍ය නේවාසිකාගාර ගිණුමට හර කර ඇත.

**2.2.3** <u>**ලැබියයුතු ගිණුම්**</u>

(අ) විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත්ව ගොස් ඇති හා මාරු වී ගොස් ඇති දැනට අර්ථසාධක අරමුදල් නිදහස් කර නැති සේවකයන්ගෙන් අයවිය යුතු කාර්ය මණ්ඩල ණය ශේෂ වශයෙන් මෙම මුදල් නියෝජනය වේ. මෙම සේවකයන් ණයමුදල් ලබා ගැනීමේ දී බැඳී ඇති ගිවිසුමට අනුව, අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ දී එම ණය මුදල් අය කර ගැනීමට ඉඩ ලැබේ. මේ අනුව එම මුදල් අර්ථ සාදක නිදහස් කිරීමේ දී අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. ස්ථාන මාරු ලැබූ සේවකයන්ගෙන් අයවිය යුතු මුදල් 2011 වර්ෂය තුළ සම්පූර්ණයෙන් ම අයකර ගෙන ඇත. අර්ථ සාධක අරමුදල් නිදහස් කිරීමත් සමග හිග මුදල් අයවනු ඇත.

**2.2.4** <u>**විගණනය සඳහා සාක්ෂි නොවීම.**</u>

ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කිරීමේ කටයුතු පරිගණකගත කිරීමට කටයුතු කරමින් පවතී. දැනට මෘදුකාංග පැකේජයක් ලබා ගෙන ඇති අතර සියළු ස්ථාවර වත්කම් සත්‍යාපනය කර දත්ත ලබා ගෙන තක්සේරු වාර්ථාද ලබා ගෙන ඇත. එම තොරතුරුද පරිඝණක පද්ධතියට ඇතුළත් කරමින් පවතී. මෙම ක්‍රියාවලිය 2013 මැයි වන විට අවසන් කර ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ලබා දීමට කටයුතු කරණු ලැබේ.

### 2.2.5 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූලනොවීම.

(අ) (i) සහ (ii).

සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වන බාහිර පාඨමාලා අරමුදල් සම්බන්ධ නීති රීති හා රෙගුලාසි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් දැනටමත් කෙටුම්පත් කර ඇත. එම නීති රීති අනුමත වී ලැබෙන තෙක් විශ්ව විද්‍යාල පාලක සභාවේ එකගත්වය මත මෙම අරමුදල් පාලනය කරනු ලැබේ.

(ආ) PGDM පාඨමාලාවේ ගමන් වියදම් ප්‍රතිපූර්තනය කිරීමේදී අය විය යුතු ප්‍රමාද ගාස්තු වලින් කොටසක් දැනටමත් අයකර ගෙන ඇත. ඉතිරිය ඉදිරි ගෙවීම් තුළින් අය කරණු ලැබේ.

(ඇ) අදාළ කල් ඉකුත් වූ තැන්පතු ශේෂ ගිණුම් වාර්තා වලින් ඉවත් කර ගැළපීම සඳහා ජර්නල් සටහන් අංක J/E 196 මගින් 2012 වර්ෂයේදී කටයුතු කර ඇත.
25/10/2012

(ඇ)

(i) ඉතා ඉක්මණින් නවක සිසුන් බඳවා ගැනීම සඳහා දේශන ශාලා පුටු 175 ක් මිළදී ගැනීමට අවශ්‍ය වූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලයේ පිහිටා කටයුතු කිරීමට කාලයක් ගතවන බැවින් ඉන් බැහැරව. ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබා ගෙන මිළදී ගෙන ඇත. මෙම තත්වයන් මග හරවා ගැනීමට කටයුතු කර ඇත.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහය අනුව ඇණවුමක් ලබා දීමට ප්‍රථම ඒ බව සැපයුම්කරුට දැණුම් දීම අවශ්‍ය වේ. එහෙත් සේවා අවශ්‍යතාවය පදනම් කර ගෙන සැපයුම්කරුට ඒ බව දුරකථනයෙන් දැණුම් දී ඇති අතර භාණ්ඩ තිසි පරිදි විශ්වවිද්‍යාලය වෙත ලබා දී ඇත. ඉන් අනතුරුව අදාළ ගෙවීම් නිසි පරිදි සිදු කර ගණුදෙණු පියවා ඇත. මෙම තත්වයන් මග හරවා ගැනීමට කටයුතු කර ඇත.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහය අනුව රු. 500,000.00 ට වැඩි ඇණවුම් සඳහා ගිවිසුමකට එළඹීම අවශ්‍ය වේ. මෙහිදී එවැනි ගිවිසුමකට එළඹී නැතත් විශ්වවිද්‍යාලය විසින් නිකුත් කර ඇති මිලදී ගැනීම් ඉන්වොයිසිය මගින් ඒ බැව් සනාථ වේ. ඒ අනුව සැපයුම්කරු භාණ්ඩ සපයා ඇති අතර ගෙවීම් කර තිසි පරිදි ගණුදෙණු පියවා ඇත. මෙම තත්වයන් මග හරවා ගැනීමට කටයුතු කර ඇත.

### 2.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

(අ) විශ්වවිද්‍යාල අධ්‍යන කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා ගෙවීම් පිළිබඳ චක්‍රලේඛය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරණු ලබයි. ඒ අනුව සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතිය තුළම මාසික හිලවු දීමනා UPF සහ ETF දායක මුදල් සඳහා අදාළ කර ගන්නේද යන්නත් එමගින් නිරණය කර ඇත. විගණන වාර්තවේ දක්වා ඇති කාලය තුළ සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතිය තුළම ක්‍රියා කර ඇත්තේ එම පරිපාටියට අනුවය. මෙම විශ්වවිද්‍යාලයද ඒ අනුව කටයුතු කර ඇත.

(ආ) සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතියේම ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිපන් සභාවේ චක්‍රලේඛ අනුව මෙම විශ්වවිද්‍යාලයේද භාෂා ප්‍රවීණතා සඳහා ගෙවීම් ක්‍රියාත්මක කරණු ලැබේ.

(ඇ) රජරට විශ්වවිද්‍යාලයේ මිහින්තලේ පරිශ්‍රය තුළ පොලිස් නිවාස පවරා ගැනීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර ඒ සඳහා අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇත. නමුත් පොලිස් දෙපාර්තමේන්තුවෙන් එම නිවාස විශ්වවිද්‍යාලයට පවරා දීමේ කටයුතු ප්‍රමාද කර ඇති බැවින් මෙම ක්‍රියාවලිය තව දුරටත් සම්පූර්ණ කර නොමැත. ලැබී තිබූ මුදල් ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුමක රඳවා තැබූ අතර ඒ සඳහා ලැබෙන පොලී මුදල්ද පොලිස් නිවාස පවරා ගැනීම සඳහා යොදා ගැනීමට එම ගිනුමේම තබා ඇත. නමුත් 2011 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ වෙනත් ඉදිකිරීම් කටයුතු සඳහා භාණ්ඩාරයෙන් අරමුදල් නිදහස් කර ගැනීමේ දුෂ්කරතාවයන් මත තාවකාලිකව ලැබී ඇති පොලිය ඉදිකිරීම් ව්‍යාපෘතිවලට ගෙවීම් කිරීමට යොදා ගෙන ඇත. පසුව නියමිත ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර අරමුදල් ලැබූ පසු පොලී මුදල් පොලිස් නිවාස පවරා ගැනීමේ කාර්යය සඳහා නැවත තැන්පත් කර ඇත.

### 2.2.7 අවිධිමත් ගණුදෙණු

(අ) විශ්වවිද්‍යාලය භාණ්ඩාගාර අනුමැතිය ලබා ගනිමින් පැරණි වාහන වෙන්දේසි කර ඇත. අලෙවියෙන් ලද මුදල් භාණ්ඩාගාර අනුමැතියට යටත්ව අලුතින් වාහන මිලදී ගැනීමේදී මූලික ගෙවීම් සඳහා යොදා ගෙන ඇත. විකිණූ වාහන ගිණුම් වාර්ථා වලින් බැහැර කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව ලැබී ඇති ලාභය මෙහෙයුම් ආදායමක් ලෙස පොත් වල සටහන් කර ඇත.

(ආ) J/E 192 24/10/2012 මගින් ගිණුම් සටහන් නිවැරැදි කිරීමට කටයුතු කර ඇත. එම මුදල් අදාළ කථිකාචාර්යවරයාගෙන් අඩු කරගනිමින් පවතී.

(ඇ) සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතියේම ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා සඳහා නිවාස පහසුකම් සපයා දෙනු ලැබේ. එම නිවාස විශ්වවිද්‍යාලය විසින් නඩත්තු කරණු ලබන අතර ඔහුගෙන් කුලී මුදල් අයකර ගණු නොලැබේ.

රජරට විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සඳහා මිහින්තලා පැරණි ගම්උදා භූමියේ තිබූ නිවාස සහනදායි කුලී පදනමක් මත කුලියට ලබා දී ඇත. එම කුලී මුදල් අයකර ගැනීම් තීරණය කිරීමේදී පාලක සභාව විසින් මිහින්තලය වැනි පහසුකම් අඩු ප්‍රදේශයක සේවකයන් රඳවා තබා ගැනීමද සැලකිල්ලට ගෙන අයකරන කුලී ප්‍රමාණය තීරණය කර ඇත. එම කාර්යය මණ්ඩල නිවාස වලින් අය කරන ජල ගාස්තු සහනදායි පදනමක් මත අය කරණු ලැබේ.

## 03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 16 සහ විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍ර ලේඛ 649 අනුව පාරිතෝෂික හා ස්ථාවර වත්කම් ක්ෂය සඳහා ප්‍රතිපාදන ඇති කිරීම තුලින් වර්ෂයේ ඌනතාවයට වැඩි බලපෑමක් සිදුව ඇත.

## 04 මෙහෙයුම් සමාලෝචනය

4 .1 කාර්ය සාධනය

(අ)
(ආ) } පිළිගනු ලැබේ.
(ඇ)

4 .2 කළමනාකරණ අකාර්යක්ෂමතා

IRQUE ව්‍යාපෘතිය යටතේ රු. දස ලක්ෂ 200 කට අධික අරමුදලක් විශ්වවිද්‍යාලයට ලැබී ඇති අතර අරමුදල් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇත්තේද රජරට විශ්වවිද්‍යාලය විසින්ය. එහෙත් 2010 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් ගත කාලය අවසන් වී ඇනවුම් 2 ක් සඳහා වන භාණ්ඩ විශ්වවිද්‍යාලයට ලැබී ඇති අතර ඒ සඳහා වූ ගෙවීම් IRQUE ව්‍යාපෘතිය මගින් නොකරන ලදී. එම භාණ්ඩ පීඨවල අවශ්‍යතාවයන් සඳහා ලබා දී ඇති අතර පීඨයන් සඳහා වෙන් කර ඇති උපකරණ මිළට ගැනීමේ අරමුදල් මගින් ගෙවීම් කර ඇත.

4.3 ආර්ථික නොවූ ගණුදෙණු

රජරට විශ්වවිද්‍යාලයේ පීඨ කිහිපයක් මිහින්තලේ ප්‍රධාන පරිශ්‍රයෙන් බැහැරව පිහිටා ඇත. තවද ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ලබා ගෙන ඇති නිවාස පිහිටා ඇත්තේද මිහින්තලේ පරිශ්‍රයෙන් බැහැරවය. මේ අනුව එම දුරස්ථ පීඨ වල සහ ශිෂ්‍ය නේවාසිකාගාරවල ජල විදුලි බිල්පත් පියවීමේදී ප්‍රමාදයන් සිදුවී ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුව ඇත. මෙම තත්වයන් මගහැරීම සඳහා ගෙවීම් කටයුතු විමධ්‍යගත කර පවත්වාගෙන යනු ලැබේ.

4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) විගණන වාර්ථාවේ දක්වා ඇති ප්‍රමාද ගාස්තු වලින් කොටසක් එනම් Shihara Saw Mill and Furniture වෙතින් රු. 14,485 ක් සහ Anurasiri Furniture (pvt) Ltd වෙතින් රු. 3,778 ක් අය කර ගෙන ඇත.

Olak Steel Furniture විසින් භාණ්ඩ සැපයීම ප්‍රමාද වී ඇත්තේ විශ්වවිද්‍යාලය විසින් ලබා දිය යුතු පිරිවිතරයන්හි අඩුපාඩු පැවති නිසාය. එසේම T.S.P. Civil Construction ආයතනය මඩකළපුව වැනි ඈත ප්‍රදේශයක පිහිටා ඇති අතර භාණ්ඩ සැපයිය යුතු කාලය තුළ ඇතිවූ අයහපත් දේශගුණික තත්වය නිසා සැපයීම් ප්‍රමාද වි ඇත. විශ්වවිද්‍යාලය විසින් මෙම තත්වයන් සලකා බලා අදාළ ප්‍රමාද ගාස්තු අයකර ගැනීමෙන් නිදහස් කර ඇත.

(ආ) විගණන වාර්ථාවේ පෙන්වා ඇති පරිදි අමතර පිරිවැයක් දරා භාණ්ඩ මිලට ගැනීමට සිදුවූයේ නැවත පිරිවිතර වෙනස් කිරීමත්, අඩුම ලංසු කරුට එය දැණුම් දීමත්, එයට ඔහු එකග නොවීමත් නිසා දෙවන ලංසුකරුට ඇණවුම ලබා දීමත් නිසාය. මෙවැනි තත්වයන් මග හරවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරණු ලැබේ.

(ඇ) සුදුසුකම් ලත් සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේදී, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන්ගේ පෞද්ගලික අත්දැකීම් අනුව P & T Trading ආයතනය වෙතින් ලබා දෙන භාණ්ඩ නියමිත ප්‍රමිතියෙන් තොර බවට තීරණය කළ අතර මහාචාර්යය ඒකකයේ සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා කල් පවත්නා සහ ඉහළ ප්‍රමිතියෙන් තොර භාණ්ඩ එම කමිටුව තීරණය කර ඇත. එබැවින් නියමිත ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ වැඩි මිලක් ගෙවමින් Delmege Medical ආයතනය වෙතින් මිළදී ගෙන ඇත.

.5 මානව සම්පත් කළමනාකරණය

අධ්‍යයන තනතුරු සඳහා පවතින පුරප්පාඩු පිරවීම සඳහා අවස්ථා ගණනාවකදී කටයුතු කර ඇත. එහෙත් සුදුසුකම් ඇති අධ්‍යයන කාර්යය මණ්ඩල බඳවා ගැනීම සම්බන්ධයෙන් පවතින අපහසුතා නිසා තවමත් මෙම පුරප්පාඩු සම්පූර්ණ කරලීමට නොහැකි වී ඇත. අනධ්‍යයන කාර්යය මණ්ඩල තනතුරු සම්පූර්ණයෙන් පුරවා මානව සම්පත් කලමණාකරණ කටයුතු විධිමත් කර ඇත.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

2011 සහ 2012 වර්ෂ සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණ අතර 2013 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත.

### 5.2 අයවැය පාලනය

විශ්වවිද්‍යාල ඇස්තමේන්තු ගත අයවැය ලේඛන පිළියෙල කරනු ලබන්නේ භාණ්ඩාරයෙන් ලබාදෙන අරමුදල් සීමාවන් පදනම් කරගෙනය. මේ සඳහා ප්‍රතිපාදන. අනුමත තනතුරු පුරප්පාඩු සඳහා පවත්නා වැටුප් තලයන්ට අනුව ඇස්තමේන්තු ගත කර ඇත. එහෙත් අයවැය වාර්තා සකස් කිරීමෙන් පසු රජය විසින් වැටුප් දීමනා වැඩි කිරීම් සිදු කරන අතර එම වියදම් පවත්නා ප්‍රතිපාදන යටතේ දැරිය යුතු වනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස අයවැය ප්‍රතිපාදන ඉක්මවා යාම සිදුවනු ඇත. මේ සඳහා අමතර ප්‍රතිපාදන සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතියේ ඉතිරි වීම් මත වර්ෂයේ අවසාන මාසය තුළ ගැළපීම් කර ලබා දෙනු ඇත.

## 6 පද්ධති හා පාලන

විශ්වවිද්‍යාලයේ පද්ධති පාලනයන්හි දුර්වලතා මගහරවා ගැනීම සඳහා මුදල් කමිටු. ප්‍රසම්පාදන කමිටු විගණන කමිටු. ඉදිකිරීම් ප්‍රගති සමාලෝචන කමිටු. උප කුලපතිගේ උපදේශන කමිටු පවත්වාගෙන යනු ලැබේ. එම කමිටු තුළින් පද්ධති හා පාලනයන්හි දුර්වලතා මගහරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය රංජිත් විජේවර්ධන
උපකුලපති

මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ